# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : ඉංජිනේරු (සිවිල්), ඉංජිනේරු (විදුලි), ඉංජිනේරු (යාන්ත්‍රික)**
**(මධ්‍යම කළමනාකරණ පළමු මට්ටම)**

**(අ) යෝග්‍යතාවය :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාවේදී (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික) උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ලබාගත් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම.

**(ආ) වැටුප :**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : 4 : 1 (MLM 1) |
| මූලික වැටුප | : රු. 74,120/= |
| වැටුප් වර්ධකය | : රු. 1,380/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 148,000/= ක් පමණ වේ.

**සටහන :** ඉංජිනේරු තනතුර සඳහා ආශ්‍රිත ඉංජිනේරු කාණ්ඩය (A Eng.) හෝ ඊට ඉහළ කාණ්ඩයක් යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) ලියාපදිංචිය අනිවාර්යය වේ.

**02. තනතුර : පෞද්ගලික ලේකම් තනතුර (කොළඹ / ත්‍රිකුණාමලය)**
**(කනිෂ්ඨ කළමනාකරණ මට්ටම)**

**(අ) යෝග්‍යතාවය :**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ලේකම් කටයුතු පිළිබඳ ඩිප්ලෝමාවක්/ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම. (ඩිප්ලෝමා පාඨමාලා කාල සීමාව අවම වශයෙන් වසර 01 ක් විය යුතුය) **සමඟ**

රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පෞද්ගලික ලේකම් තනතුරක වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

**(ආ) වැටුප :**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : 5 (JLM) |
| මූලික වැටුප | : රු. 60,050/= |
| වැටුප් වර්ධකය | : රු. 1,150/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 134,000/= ක් පමණ වේ.

**සටහන 1 :** අයදුම්කරුවන් ස්වයං අභිප්‍රේරිත විය යුතු අතර, වාර්තා, ලිපි ආදිය කෙටුම්පත් කිරීමට හා වෙනත් සියලුම ලේකම් කටයුතු ස්වාධීනව ඉටුකිරීමට හැකි ඉංග්‍රීසි හා සිංහල භාෂා පිළිබඳ මනා දැනුමකින් යුක්ත විය යුතුය.

**සටහන 2 :** පෞද්ගලික ලේකම් තනතුර සඳහා ඉල්ලුම් කරන වරාය සඳහන් කළ යුතුයි.

**වයස් සීමාව**

අවුරුදු 45ට අඩුවිය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය සේවයේ හෝ ව්‍යවස්ථාපිත සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් හට අදාළ නොවේ)

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, මානව සම්පත් කොට්ඨාශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2023-12-07 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති.**